# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 581/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 04/04/2024 පැය 1200

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ගාල්ල පොලිස් වසම.

2024.04.03 වන දින රාත්‍රී කාලයේ ගාල්ල පොලිස් වසමේ දංගෙදර ඩිඩිස් වත්තේදී තියුණු ආයුධයකින් පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට ගාල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ දංගෙදර, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දෙපිරිසක් අතර ඇතිවූ ආරවුලක් දුරදි ගයාමෙන් මෙම ඝාතනය සිදුව ඇති බව දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඝාතනය සම්බන්ධයෙන් අවුරුදු 20 ත් 54 ත් අතර වයස් වල පසුවන දංගෙදර ප්‍රදේශයේ සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. ගාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - කුඹුක්ගැටේ පොලිස් වසම.

2024.04.03 වන දින දහවල් කාලයේ කුඹුක්ගැටේ පොලිස් වසමේ ඉබ්බාගමුව මඩගල්ල මාර්ගයේ කිලෝ මීටර් 07 කණුව අසලදී මඩගල්ල දෙස සිට ඉබ්බාගමුව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු සහ පිටුපස ගමන්කළ රියදුරුගේ බිරිඳ පොල්ගොල්ල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් ප්‍රතිකාර ලබමින් සිටියදී බිරිඳ මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 27 ක් වූ කෝම්බුව, කුඹුක්ගැටේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුඹුක්ගැටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**